# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 12,133 — 1960 මැයි 20 වැනි සිකුරාද — 20.5.1960**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# IV වැනි කොටස — පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි, සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකටම වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | 95 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... | — |
| තනතුරු—ඇබෑර්තු ... ... | — | අය-වැය ලේඛන ... ... | 97 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — | දේපල විකිණීම ... ... | — |
| අතුරු ව්‍යවසාය ... ... | — | මාගී කොමිටි දැන්වීම් ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් | — | විවිධ දැන්වීම් ... ... | 98 |


## පළාත් පාලන නිවේදන

### 1950හේ අංක 19 දරණ විදුලි බලය පිළිබඳ ආඥාපනත

ප්‍රවාහණ සහ විදුලි බලය පිළිබඳ අමාත්‍යතුමාගෙන් විමසා පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් දෙන ලද අනුමතිය ඇතුව පොලොන්නරුව දිස්ත්‍රික්කයේ පොලොන්නරුව ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව විසින් 1960හේ අංක 19 දරණ විදුලි බලය පිළිබඳ ආඥාපණතේ 46 වන වගන්තිය යටතේ සම්පාදිත නියෝග

වී. සී. ජයසූරිය,
පලාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථාවර ලේකම් තැන.

1960 මැයි 4 වැනි දින,
කොළඹ දීය.

**නියෝග**

1. මේ නියෝගවල—

"ආඥාපණත" යනුවෙන් 1950 හේ අංක 19 දරණ විදුලි බලය පිළිබඳ ආඥාපනත අදහස් කරනු ලැබේ.

"බලපත්‍රය" යනුවෙන් ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ පොලොන්නරුව ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව වෙත නිකුත් කරන ලද බලපත්‍රය අදහස් කරනු ලැබේ.

"බලපත්‍රධාරියා" යනුවෙන් පොලොන්නරුව දිස්ත්‍රික්කයේ පොලොන්නරුව ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව අදහස් කරනු ලැබේ.

2. තම ප්‍රයෝජනය පිණිස බලපත්‍රධාරියාගෙන් විදුලි බලය ලබා ගැනීමට බලාපොරොත්තුවන ඕනෑම කෙනෙකු විසින් (අ) විදුලි බලය ලබා ගැනීමට ඕනෑ කරන දිනට යටත් පිරිසෙයින් දවස් දහතරකට මත්තෙන් ඒ සඳහා බලපත්‍රධාරියා විසින් සපයනු ලබන ෆෝර්මයේ ප්‍රකාරයට ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ යුතුයි.

(ආ) ඕනෑම කෙනෙකුවිසින් විද්‍යුත් වේගවාහක කම්බිය සඳහා ගාස්තු බලපත්‍රධාරියා වෙත කලින් ගෙවිය යුතුවාක් හැර බලපත්‍රධාරියාට අවශ්‍ය වන්නේ නම් ආඥාපණතේ 33 වැනි වගන්තිය යටතේ බලපත්‍රධාරියා සමග ලියවිල්ලකින් වූ ගිවිසුමකටද ඇතුළත් විය යුතුයි.

3. විදුලි බලය පාවිච්චි කරන සෑම පාරිභොගිකයෙකු විසින්ම බලපත්‍රයේ සඳහන් කරන ලද රේට් ගණන අනුව එකී විදුලි බලය සඳහා මුදල් ගෙවිය යුයි.

4. (1) පාරිභොගිකයාට අයත් භූමි භාගයෙහි පිහිටුවා තිබෙන විද්‍යුත් වේගවාහක කම්බියේ කොටස හා විදුලි බලය වෙනස් කරන ලද උපකරණ ද ප්‍රධාන ගිනි නූල හා විද්‍යුත් මාපකයද විදුලියතුරු පුවරුවද බලපත්‍රධාරියා සතුව පවත්නේ ය. බලපත්‍රධාරියාගෙන් අවසර ලත් සේවකයෙකු හැර වෙන කිසිම කෙනෙකු විසින් මොනම කාරණයක් සඳහාවත් ඒවා වෙනස් කිරීම හෝ අතපතගෑම හෝ නොකළ යුතුයි.

(2) පාරිභොගිකයා විසින් සවකීය පාර්ශවයේ ඇත්තාවූ බලපත්‍රධාරියාගේ ප්‍රධාන ගිනි නූලේ හෝ මීටරයේ කම්බි, විදුලි කම්බි හෝ උපකරණ නඩත්තු කිරීම ගැන වගකිව යුතුය.

(3) ආඥාපණතේ 47 (3) වැනි වගන්තිය යටතේ අසම්බන්ධ කරන ලද යම්කිසි සවිකිරීමක් නැවත සම්බන්ධ කරන කල්හි එකී සවි කිරීම නැවත සම්බන්ධ කිරීම හා පරීක්ෂාකර බැලීම සඳහා බලපත්‍රයේ සඳහන් ප්‍රකාර ගාස්තුවක් පාරිභොගිකයා විසින් කලින් ගෙවිය යුතුය.

(4) කිසියම් පාරිභොගිකයෙකුගේ විදුලි කම්බි හෝ සවි කිරීම්වල ඇතැම් කොටසකින් විදුලි බලයක් කාන්දුවන විට, ස්වකීය ස්ථානයේ එසේ කාන්දු වී යන මීටරයේ සඳහන් සියලුම විදුලි බලය සඳහා පාරිභොගිකයා විසින් මුදල් ගෙවීමට යටත් විය යුතුය.

5. (1) තමාට විදුලි බලය සැපයුවාට පසු යම් විටෙක යම්කිසි ලාම්පුවක් හෝ දැනට පාවිච්චි කරන මීටරයකට වඩා විශාල වූ මීටරයක් පාවිච්චි කිරීමට හෝ වැඩිපුර යම්කිසි ලාම්පුවක් හෝ නිත්‍ය

වශයෙන් හෝ තාවකාලික වශයෙන් විද්‍යුත් ප්‍රවාහයෙන් ක්‍රියා කරන උපකරණයක් සවි කිරීමට හෝ තමාගේ දේපලෙහි ඇද තිබෙන විදුලි කම්බි කොයි අන්දමකින් නමුත් වෙනස් කිරීමට හෝ දික් කිරීමට අදහස් කරන සෑම පාරිභොගිකයෙකු විසින්ම එබඳු දික් කිරීමක් හෝ වෙනස් කිරීමක් පිළිබඳ කටයුතු ආරම්භ කිරීමට යටත් පිරිසෙයින් දින දෙකකටවත් මත්තෙන් ඒ පිළිබඳ විදුලි කර්මාන්ත පිළිබඳ කොන්ත්‍රාත්කරුවාගේ නම සහ ලිපිනය ද සමග ඒ බව බලපත්‍රධාරියාට ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

(2) කිසිම පාරිභොගිකයකු විසින් කිසියම් දීර්ඝ කිරීමක්, ලාම්පුවක් හෝ පන්කාවක් හෝ දැනට පාවිච්චි කරන මීටරයට වඩා විශාල වූ මීටරයක් පාවිච්චි කිරීමට හෝ වැඩිපුර යම්කිසි ලාම්පුවක් හෝ නිත්‍ය වශයෙන් හෝ තාවකාලික වශයෙන් හෝ විද්‍යුත් ප්‍රවාහයෙන් ක්‍රියා කරන උපකරණයක් විද්‍යුත් වේගවාහක ප්‍රධාන කම්බි යට සවි කිරීම, බලපත්‍රධාරියා විසින් ඒ සඳහා බලය පවරන ලද නිලධාරියකු විසින් පරීක්ෂා කොට හෝ විභාග කොට බලා සතුටු දායකයයි ඒත්තුගත හොත් මිස නැත්නම් එකී දීර්ඝ කිරීම, ලාම්පුව, පංකාව, මීටරය, වැඩිපුර ලාම්පු හෝ වෙනත් උපකරණ සවි නොකළ යුතුයි.

6. (1) යම්කිසි ස්ථානයක බලපත්‍රධාරියාගේ ගිනි නූල උණුවී යනු ලබන්නේ නම්, පාරිභොගිකයා විසින් ඒ බව වහාම බලපත්‍රධාරියාගේ විද්‍යුත් පාදකාගාරය හෝ උප විද්‍යුත් පාදකාගාරය භාර නිලධාරියා වෙත කාරණයේ හැටියට දැනුම්දිය යුතුයි.

(2) බලපත්‍රධාරියා විසින් බලය දෙන ලද නිලධාරියකුගෙන් හෝ බලපත්‍රධාරියා විසින් රක්ෂාවෙහි යොදවාගෙන සිටින වැඩ කරුවකුගෙන් බාහිරවූ කිසිවකු විසින් බලපත්‍රධාරියාගේ දේපල වශයෙන් සලකනු ලබන උණු වී ගිය ගිනි නූල වෙනුවට වෙනින් ගිනිනූලක් දැමිය යුතු නැත.

(3) පාරිභොගිකයාගේ හෝ බලපත්‍රධාරියාගේ දේපල වශයෙන් සලකනු ලබන කිසියම් ගිනි නූලක් අලුතෙන් දැමීමට බලපත්‍රධාරියාගේ කම්කරුවකුගේ හෝ නිලධාරියකුගේ සේවය වුවමනා කරන්නේ නම්, ඒ සඳහා ගෙවිය යුතු බලපත්‍රයේ සඳහන් නියම ගාස්තුව පාරිභොගිකයාගේ මාසික ගණන් බිලට්වලට ඇතුළත් කළ යුතුයි.

7. සම්පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන් හෝ විදුලි බලය සැපයීමේ දී සිදුවන බාධා හේතු කොට ගෙන නියම වශයෙන් හෝ අනියම් වශයෙන් හෝ සිදුවන පාඩුවක් හෝ අලාභ හානියක් සම්බන්ධයෙන් බලපත්‍රධාරියා පාරිභොගිකයාට වග නොකිය යි.

8. ආඥාපණතේ 45 වැනි වගන්තිය යටතේ අසම්බන්ධ කොට තිබුනා වූ සේවයක් නැවත සම්බන්ධ කරන කල්හි හරි වැරදි සෝදිසි කොට නැවත සම්බන්ධ කිරීම සඳහා බලපත්‍රයේ සඳහන් ගාස්තුව අය කළ යුතුවාත් හැර එය පාරිභොගිකයා විසින් කලින් ගෙවිය යුතුද වන්නේ ය.

9. (1) සියලුම ගාස්තු, ගනුදෙනු ඉදිරිපත් කරන දිනයට අය විය යුතුව තිබෙන්නාසේ සලකනු ලැබේ.

(2) ගණුදෙනු පිළිබඳ වූ යම් පැමිණිල්ලක් එකී ගණුදෙනු ඉදිරිපත් කොට සතියක් ඇතුළත දී කරන ලද්දේ නම් මිස නැත්නම් ගණුදෙනු වල වැරදි පිළිබඳ වූ කිසිම පැමිණිල්ලක් බලපත්‍රධාරියා විසින් භාර ගනු නොලැබේ.

10. (1) ස්වකීය පදිංචි ස්ථානය සඳහා විදුලි බලය සැපයීම අනවශ්‍යයයි අදහස් කරන සෑම පාරිභොගිකයකු විසින්ම ඒ බව තුන් දවසකට කලින් බලපත්‍රධාරියා වෙත ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

(2) (1) ඡේදයේ සඳහන් පරිදි එසේ දැනුම් දීමක් කර නොමැති කල්හි විදුලි බලය අනවශ්‍ය බව දන්වමින් බලපත්‍රධාරියාට දැන්වීම ලැබුන දින සිට දවස් තුනක් ගතවන තුරු තමා පදිංචි ස්ථානයේ වූ බලපත්‍රධාරියාගේ උපකරණ සම්බන්ධයෙන් පාරිභොගිකයා වග කිව යුතු අතර ඒ ස්ථානයේ පාවිච්චිකරන්නට යෙදුන සියලු විදුලි බලය සම්බන්ධයෙන් පාරිභොගිකයා ගාස්තු ද ගෙවිය යුතුය. එහෙත්, එකී දවස් තුන අවසාන වන්නට මත්තෙන් බලපත්‍රධාරියා විසින් සේවය අසම්බන්ධ කරන ලද්දේ නම් ඒ ස්ථානයේ පාවිච්චි කරන ලද විදුලි බලය සම්බන්ධයෙන් පාරිභොගිකයා ගාස්තු ගෙවිය යුත්තේ එසේ අසම්බන්ධ කළ වේලාව දක්වා පමණකි.

11. (i) කිසියම් පාරිභොගිකයකු විසින්—

(අ) රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු හා කෘත්‍යාධිකාරි මහතා විසින් විදුලි කටයුතු කරගෙන යාමට අවශ්‍ය ප්‍රාගුන්‍ය ඇතැයි කියා සහතික කරන ලද්දාවූ හෝ අනුඥාත විදුලි කටයුතු පිළිබඳ වැඩපොලක හෝ වෙළඳ සමාගමක හෝ විදුලි බල ස්ථානයක යටත් පිරිසෙයින් අවුරුදු තුනකවත් ප්‍රායෝගික කෘතහස්තතාවක් ලබා ඇත්තාවූ; හෝ

(ආ) අවුරුදු දෙකකට නොඅඩු කාලපරිච්ඡේදයක් තුළ නොකඩවා විදුලි කටයුතු පිළිබඳ ඉංජිනේරු කර්මාන්තයෙහි ව්‍යාවෘතව සිටියාවූ හෝ කෙනෙකු නොවන කවරකු වුවත්;

(ඇ) බලපත්‍රධාරියාගේ විදුලි සම්පාදක සංදාමයට සම්බන්ධ කරන්නාවූද, පාරිභොගිකයාගේ යම්කිසි දේපලක පිහිටි යම්කිසි උපකරණ සමුච්ඡයකට අදාල වන්නාවූද කම්බි දැමීම හෝ විදුලි උපකරණ හෝ දේවල් සවිකිරීම පිළිබඳ වූ කවර කටයුත්තක් කරගෙන යාම සඳහා; හෝ

(ඇ) පාරිභොගිකයාගේ යම්කිසි දේපලක පිහිටි විදුලි උපකරණ සමුච්ඡය සම්බන්ධයෙන් බලපත්‍රකාරයාගේ විදුලි සම්පාදක සංදාමයට එකී උපකරණ සමුච්ඡය සම්බන්ධ කළාට පසු—

(i) එකී උපකරණ සමුච්ඡය වෙනස් කිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම හෝ ඊට අලුතෙන් කෑලි දැමීම යන මේවායින් සංයුක්ත වූ හෝ ස්වභාවයෙන් ඒ හා සමාන වූ කිසිම විදුලි කර්මාන්තයක්; හෝ

(ii) එකී උපකරණ සමුච්ඡයේ ස්වභාවයත්, භාරයත් කිසිම විධියකින් වෙනස් නොකරන්නාවූ නොහොත් ඊට හානි කර නොවන්නා වූ ප්‍රකාරයට ලාම්පු, පංකා, විදුලි යතුරු හෝ වෙනත් සංයෝජන කොටස් වෙනුවට සාමාන්‍යයෙන් අලුත් ඒවා දැමීම හැර වෙන කිසිම විදුලි කර්මාන්තයක් කිරීම සඳහා; හෝ නොයෙදිය යුතුය.

12. (1) යෝජනා කර තිබෙන කර්මාන්තය බලපත්‍රධාරියාගේ නිලධාරියෙකුට පරීක්ෂාකර බැලීමට හැකිවන පරිද්දෙන් ඒ පිළිබඳව දවස් දෙකකට නොඅඩු දින ගණනකට කලින් දැනුම් දීමෙන් පසුව මිස නැත්නම් එවකට සවිකොට තිබෙන විදුලි කම්බි යන්ත්‍ර සූත්‍ර උපකරණ ආදිය සකස් කිරීම හෝ ඒවා හරිගැස්සීම ද ඇතුලුව විදුලි කම්බි යන්ත්‍ර සූත්‍ර උපකරණ ආදිය සවි කිරීම වැනිවූ කිසිම කර්මාන්ත ආරම්භ කිරීම නොකට යුතුයි.

(2) යෝජනා කරන ලද කර්මාන්තය (1) වැනි ඡේදයේ සඳහන් නිලධාරියා විසින් අනුමත කරතොත් ඔහු විසින් විද්‍යුත් මාපකය සවිකළ යුතු ස්ථානය කොන්ත්‍රාත්කරුවා සමග සාකච්ඡා කොට නියම කරනු ඇත. කොන්ත්‍රාත්කරුවා ආඥාපණතේ 60 වැනි වගන්තිය යටතේ ඒ සඳහා සම්පාදනය කරනු ලබන යම් යම් නියෝගවලට අනුකූලව ඒ කර්මාන්තය කරගෙන යා යුතුය.

13. (1) 12 වැනි නියෝගයේ සඳහන් යම් විදුලි කර්මාන්තයක් සම්පූර්ණ කළ විට බලපත්‍රධාරියා විසින් බලය දෙන ලද නිලධාරියෙකු විසින් එකී කර්මාන්තය පරීක්ෂා කොට හා සෝදිසි කර බලා—

(අ) විදුලි කම්බි ආදිය සවිකිරීම නියමිත නියෝගවලට පවත්නේ නම් ඒ ස්ථානයට විදුලි බලය සපයනු ලැබේ;

(ආ) විදුලි කම්බි ආදිය සවිකිරීම නියමිත නියෝගවලට එකඟව නොපවත්නේ නම් විදුලි කම්බි ආදිය එකී නියෝග වලට එකඟ වන පරිද්දෙන් සකස් කරන තුරු විදුලි බලය සපයනු නොලැබේ.

(2) මේ නියෝග යටතේ කිසියම් විදුලි කම්බි සවි කිරීමක් පරීක්ෂාකර බැලීම හා සෝදිසි කර බැලීම සඳහා ගෙවිය යුතු ගාස්තුව පාරිභොගිකයා විසින් කලින් ගෙවිය යුතුය.

14. බලපත්‍රධාරියා වෙත දැන්වීමක් නොකරනු ලැබ හා ඔහුගේ අනුමතිය කලින් ලබා නොගෙන කිසියම් ස්ථානයක අලුතෙන් විදුලි උපකරණ සවි කිරීමක් සම්බන්ධයෙන් වූ යම් වැඩක් කරගෙන යන්නේ නම් බලපත්‍රධාරියා විසින් එකී විදුලි කර්මාන්තය කරගෙන යන ස්ථානයට විදුලි බලය සැපයීම ප්‍රතික්ෂේප කළ හැකිය. එසේ නැත්හොත් අවශ්‍යය යි බලපත්‍රධාරියා විසින් බලපත්‍රය දෙන ලද නිලධාරියා අදහස් කරන පරිද්දෙන් විදුලි කම්බි ඇද තිබෙන හැටි වෙනස් කිරීමට හෝ අමුතු කිරීමට හෝ පාරිභොගිකයාට නියම කළ හැකිය. එකී වෙනස් කිරීම් හා අමුතු කිරීම විධිමත් පරිදි කළහොත් විදුලි කම්බි සවිකිරීම එකී නිලධාරියා විසින් නැවත පරීක්ෂාකොට හා සෝදිසි කොට බලා නියම පිළිවෙලට ඒවා සවිකර තිබෙන බව පෙනුනොත් එම ස්ථානයට විදුලි බලය සපයනු ලැබේ.

15. බලපත්‍රධාරියාට කලින් දැන්වීමක් නොකරද ඔහුගෙන් අවසරයක් ලබා නොගෙනද බලපත්‍රධාරියාගේ විද්‍යුත් වේගවාහක ප්‍රධාන කම්බියට සම්බන්ධ කොට ඇත්තාවූ විදුලි කම්බි උපකරණ ආදිය පිළිබඳව යම් කිසි දීර්ඝ කිරීමක් කිසියම් විදුලි කටයුතු පිළිබඳ කොන්ත්‍රාත්කරුවකු විසින් කරගෙන යනු ලබන විට සම්පූර්ණ සවි කිරීම බලපත්‍රධාරියාගේ විද්‍යුත් වේගවාහක ප්‍රධාන කම්බියෙන් වෙන්කරනු ලැබීමට යටත්වනු ඇත.

16. කිසියම් විදුලි කර්මාන්තයක් නැවත සම්බන්ධ කිරීම සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම බලපත්‍රධාරියා විසින් ඒ සඳහා සපයනු ලබන පෝර්මයේ ප්‍රකාරයට විය යුතුවාත් හැර විදුලි බලය අවශ්‍ය වන්නට පැය 48 කට නොඅඩු කාලයකට ප්‍රථම එය බලපත්‍රධාරියාගේ කාර්යාල වෙත ඉදිරිපත් කළ යුතුද වන්නේ ය.

L.G.D.–G.B 14/17/7

## 1946යේ අංක 12 දරණ විනෝද බදු ආඥපනත

වර්ෂ 1946යේ අංක 12 දරණ විනෝද බද්ද පිළිබඳ ආඥපණතේ, 2 වෙනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගාලු දිස්ත්‍රික්කයේ හිනිදුම ගම් ප්‍රදේශයේ ගම්කායර්‍ය සභාව විසින් සම්මතකර ගන්නා ලද පහත දක්වෙන යෝජනාව පළාත් පාලනය පිළිබඳ ඇමතිතුමා විසින් අනුමත කර තිබේ. එකී වගන්තියේ 1 වැනි උපවගන්තියේ ප්‍රකාර එය පළකරනු ලැබේ.

### යෝජනාව

" වර්ෂ 1946 අංක 12 දරණ විනෝද බද්ද පිළිබඳ ආඥපනතේ 2 වෙනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගම්කායර්‍ය සභාව විසින් මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට ගම් ප්‍රදේශයේ ගම්කායර්‍ය සභාවේ පාලන බල සීමාව ඇතුළත පැවැත්වෙන (ආඥපනතේ විස්තර කර තිබෙන) විනෝද සඳහා ප්‍රවේශවීම පිණිස අය කරනු ලබන ගෙවීම්වලින් මෙහි පහත දක්වෙන රේට් ගණන් අනුව බද්දක් පණවා අයකරනු ලැබේ :—

| අය කිරීම | බද්දේ රේට ගණන රු. ශ. |
|---|---|
| බද්ද හැර ඇතුලත්වීමේ ගාස්තුව— | |
| (අ) ශත 20 කට අඩු නොවන්නාවූ එහෙත් ශත 50 කට වැඩි නොවන්නාවූ විට ... ... ... | 0 05 |
| (ආ) ශත 50 කට වැඩි වන්නාවූ එහෙත් රුපියලකට වැඩි නොවන්නාවූ විට ... ... ... | 0 10 |
| (ඇ) රුපියල් 1 කට වැඩි වන්නාවූ එහෙත් රුපියල් 1.50 කට වැඩි නොවන්නාවූ විට ... ... | 0 15 |
| (ඈ) රුපියල් 1.50 කට වැඩි වන්නාවූ එහෙත් රුපියල් 2 ට වැඩි නොවන්නාවූ විට ... ... | 0 20 |
| (ඉ) රුපියල් 2 කට වැඩි වන්නාවූ එහෙත් රුපියල් 3 ට වැඩි නොවන්නාවූ විට ... ... ... | 0 30 |
| (ඊ) රුපියල් 3 ට වැඩි වන්නාවූ එහෙත් රුපියල් 4 ට වැඩි නොවන්නාවූ විට ... ... ... | 0 40 |
| (උ) රුපියල් 4 ට වැඩි වන්නාවූ එහෙත් රුපියල් 5 ට වැඩි නොවන්නාවූ විට ... ... ... | 0 50 |
| (ඌ) රුපියල් 5 ට වැඩි වන්නාවූ එහෙත් රුපියල් 10 ට වැඩි නොවන්නාවූ විට ... ... ... | 1 00 |
| (එ) රුපියල් 10 ට වැඩි වන්නාවූ විට— | |
| (1) පළමු වැනි රුපියල් 10 ට ... ... | 1 00 |
| (2) වැඩි වන්නාවූ එක් එක් රුපියල් 5 ට හෝ ඉන් කොටසකට... ... ... | 1 00" |

වී. සී. ජයසූරිය,
පළාත්පාලන හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1960 මැයි මස 3 වැනි දින,
කොළඹදීය.

---

## 1946යේ අංක 57 දරණ පළාත් පාලන (පාලන කොට්ඨාශ) පිළිබඳ ආඥපනත

මෙහි පහත නම් සඳහන් පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ පත්වීම 1960 ජූනි මස 1 වැනිදා සිට ක්‍රියාත්මක වන බව පොදු මහ ජනයාගේ දැනගැනීම පිණිස මෙයින් නිවේදනය කරණු ලැබේ.

ඇන්.සිවරාජා මහතා—ත්‍රිකුණාමලේ ප්‍රාදේශීය කාර්යාලය.

වී. සී. ජයසූරිය,
වැඩබලන පළාත් පාලන කොමසාරිස්.

---

## ගල්බඩ කෝරළේ ගම්කාර්ය සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ (201 වන පරිච්ඡේදය) 13 ඒ වගන්තිය යටතේ නිකුත් කෙරෙන නියෝගයයි

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපණතේ (201 වන පරිච්ඡෙදය) 13 ඒ දරණ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බල යේ ප්‍රකාර නිසි බලධාරියාවූ, කෑගල්ල දිස්ත්‍රික්කයේ ගල්බඩ කෝරළේ ගම්කාර්ය සභාවේ සභාපති මුහන්දිරම් රාළලාගේ බණ්ඩාර දාස්වත්ත වන මම, පහත සඳහන් දිනයන්හි ගල්බඩ කෝරළේ ගම්ප්‍රදේශය ඇතුළත මස් පිණිස සතුන් මැරීම මෙයින් තහනම් කරමි :

1960, මැයි 10 සහ 11.
1960, ජූනි 8.
1960, ජූලි 9.
1960, අගෝස්තු 7.
1960, සැප්තැම්බර් 5.
1960, ඔක්තෝබර් 5.
1960, නොවැම්බර් 3.
1960, දෙසැම්බර් 3.

ඇම්. ආර්. බී. දස්වත්ත,
ගල්බඩ කෝරළේ ගම්කාර්ය සභාවේ සභාපති තැන.

ගම්කාර්ය සභා කාර්යාලය,
මාවනැල්ල.
1960 මැයි මස 6 වන දින දිය.

---

# අය-වැය ලේඛන

## වාද්දුව සුළු නගර සභාව

### 1960 අංක 1 දරණ අතුරු වැය ලේඛනය

| වැය ශීර්ෂය | මුදල රු. ශ. |
|---|---|
| බී. මහා මාර්ග— | |
| 8. සංස්කරණය ... ... ... | 7,000 00 |
| සී. නගර සභා ඉඩම් හා ගොඩනැගිලි— | |
| 4. නඩත්තු කිරීම ... ... | 5,000 00 |
| | 12,000 00 |

1960 මාර්තු මස 11 වෙනි දින සභා සම්මත කරන ලදී.

ඇම්. ඩී. ඒ. ගුණතිලක,
සභාපති.

නගර සභා කායර්‍යාලය,
අප්‍රියෙල් 26, 1960.

අනුමත කරනලදී.

ඇස්. සුන්දරමූර්ති,
පලාත් පාලන කොමසාරිස් වෙනුවට.

1960 මැයි මස 6 දින,
කොළඹ.

# විවිධ දැන්වීම්

## ගල්ගමුව ගම්කාර්ය සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණත

මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1960 වර්ෂයට බල පත්‍රයක් ඉල්ලුම් කර තිබෙන බවත් මෙම බල පත්‍රය නිකුත් කිරීමට විරුද්ධව කුරුණෑගල දිස්ත්‍රික්කුවේ ගල්ගමුව ගම්කාර්ය සභා ප්‍රදේශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධවන්නේ අසවල් කරුණ නිසායයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටිනසේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට 14 දිනක් ඇතුළත මාවෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ 201 පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥාපණතින් සංශෝධිතවූ අංක 6 දරණ ආඥාපණත යටතේ මෙයින් දැනුම් දෙමි.

#### උපලේඛනය

ඉල්ලුම්කරුගේ නම: 1. බී. ජෝශප් පෙරේරා;
වෙළඳාම: හරක්මස්;
ස්ථානය: ගල්ගමුව මාර්කට් පොල.

ආර්. ඇම්. ඩිංගිරිබංඩා,
ගම්කාර්ය සභාවේ ප්‍රධාන තැන.

ග. කා. සා. කාර්යාලය,
ගල්ගමුව.
1960 මැයි මස 3 වැන දින,

## විශෙෂ නිවේදනයයි

1960 ජූනි 8 වැනි බදාදා ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1960 ජූනි 10 වැනි දින නිකුත්කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1960 ජූනි 4 වැනි සෙනසුරාදා පස්වරු 12.30 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1960 මැයි 19 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.